


## අපගේ ආරම්භය



උත්තරීතර මහානායක අග්ගමහාපණ්ඩිත මහෝපාධ්‍යාය අපවත් වී වදාල ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ උත්තරීතර මහානායක ධූරන්දර අතිපූජ්‍ය කොටුගොඩ ධම්මාවාස මාහිමිපාණන් සුරතින් 1990 වසරේ දී අප ආයතනය විවෘත කරන ලදී.




### තායි සුමේධා සුවඳවත් වූ හැටි

ව්‍යාපාරික කටයුත්තක් සඳහා 1989 වසරේ තායිලන්තයේ සිදු කළ සංචාරය අතරතුර අහම්බෙන් මුණුගැසුණු ශ්‍රී ලාංකික ගරු ස්වාමීන් වහන්සේ නමකගේ ඉල්ලීම වූයේ තත්ත්වයෙන් ඉහළ නිමාවකින් යුත් හඳුන්කූරක් නිපදවා වෙළඳපොළට නිකුත් කරන ලෙසයි. තායිලන්තයේදී ගත් ක්ෂණික තීරණයක් මත හඳුන්කූරු පැකට්ටුව නිෂ්පාදනය කළ අතර, තායිලන්ත රටට ගෞරවයක් ලෙස තායි යන නාමයත්, සුමේධ යන මාගේ නමත් සම්බන්ධ කර තායිසුමේධ යන නාමයෙන් වෙළඳපොළට නිකුත් කරන ලදී. මේ වන විට ජාත්‍යන්තර වෙළඳපොළ ජය ගනිමින් රටවල් 20 කට අධික සංඛ්‍යාවකට අපගේ නිෂ්පාදනයන් අපනයනය කරන අතර ලංකා සුමේධ නමින් අප නිෂ්පාදන දේශීය සහ විදේශීය වෙළඳපොළ අත්පත් කරගෙන ඇති

දේශමාන්‍යය, දේශකීර්ති සුමේධ ඇල්පිටිය

### History of THAI SUMEDA

in 1989 I went to Thailand to buy garments for my local apparel outlet. while in my business trip I decided to visit one of the Bangkok temples and ended up meeting a Sri Lankan monk. I was advised by the monk to develop a high quality pack of incense sticks for Sri Lanka. Having no knowledge of manufacturing such a product I was first hesitant to start the business, but was convinced by monk and with a strong enterpreneurial mindset I moved to produce incense stick after receiving a basic training in the manufacturing process. From the beginning my intension to introduce a high quality product to the market and differentiate from the other manufacturers. Despite of the comparatively high price point of my incense stick, the brand has become increasingly popular among users and has gradually achieved the top position in the market less than five years.

Sumeda Elpitiya



ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය මගින් 1992 වසරේ BMICH හිදී පවත්වනු ලැබූ කර්මාන්ත ප්‍රදර්ශනයේදී හොඳම දේශීය නිෂ්පාදනයට හිමි සම්මානයෙන් තායි සුමේධා ආයතනය ප්‍රථම වරට පිදුම් ලැබූහ. ජනාභිමානී ගෞරව ප්‍රණාම 2018 හෙළයේ මහාවිරු රාවණා රාජාභිමානී උත්තම සේවා සම්මානයෙන් සභාපති සුමේධ ඇල්පිටිය මහතාත්, හෙළයේ මහවිරු රාවණා රාජාභිමාන ගෞරව සම්මානයෙන් තායි සුමේධ ආයතනයත් පිදුම් ලැබුවේ පාරිභෝගික ඔබ, අප කෙරෙහි තැබූ අචල විශ්වාසයෙනි.



"THAI SUMEDA" was honored with the "BEST LOCAL PRODUCT '92" for the first time at the award ceremony held at BMICH, Oragarnize by **IDB**.The President of Thai Sumeda Enterprises Mr. Sumeda Elpitiya was honored with "Janabimani Gaurava" award and "THAI SUMEDA" was honored with "Helaye Maha Viru Ravana Rajabimani Gaurava Pranama" in 2018 held at BMICH. The event was hosted by All Ceylon Independent Media Organization presented the two accolades to "THAI SUMEDA" in recognition of its contribution to the national economy through the worldwide distribution of high quality incense sticks of different types and for prioritizing social welfare.



2019 මාර්තු මස 08 වන දින මැලේසියාවේ ක්වාලාලම්පූර්හිදී **B.W.I.O. (USA)** සංවිධානය විසින් පිරිනමන ලද ආසියාතික කර්මාන්ත ආයතන අතරින් හොඳම නිෂ්පාදන තත්ත්වයෙන් යුතු කර්මාන්ත ආයතනය ලෙස ලංකා සුමේධ ආයතනය සම්මානයට පාත්‍ර වූ අතර 2020 හොඳම ව්‍යවසායකයාට හිමි ප්ලැටිනම් සම්මානයෙන් දෙවන වරටද පිදුම් ලැබූ බව සතුටින් දැනුම් දෙමි.

Thai Sumeda Enterprises was honored with the award "Sri Lankan Businessmen of the year in Sri Lanka by B.W.I.O. (USA) organization at the award ceremony held at Kuala Lumpur,Malaysia on 8th March 2019 and Award for year 2020 Best Entrepreneur of the Year Platinum Large Award for Second time from BWIO (USA) at Taj Samudra Hotel, Colombo..

වසර ගණනාවක සිට ඒකාධිපතිත්වය දරමින් ලොවටම හඳුන්කූරු අපනයනය කළ ඉන්දියාවට අභියෝග කරමින් සහ ඉන්දියාවෙන් ආනයනය කළ හඳුන්කූරු වෙනුවට දේශීයව ලංකා සුමේධා ආයතනයේ නිෂ්පාදිත ඉහළ තත්ත්ව පාලනයෙන් යුත් ලංකා සුමේධා හඳුන්කූරු අපනයනය වැඩිදියුණු කිරීමට ලැබීම දේශය වෙනුවෙන් අප ලද මහත් භාග්‍යයක් සහ ජයග්‍රහණයක් සේ සළකන අතර, අගය එකතු කර නිෂ්පාදනයෙන් විදේශ වෙළඳ පලට නිකුත් කිරීමෙන් ශ්‍රී ලංකාවට විදේශ විනිමය ගෙන ඒමට ලැබීම අප ලද ජයග්‍රහණයකි

මේ වන විට අප ආයතනය විදේශ රටවල් 20 කට පමණ අපගේ ලංකා සුමේධා නිෂ්පාදන අපනයනය කරමින් විදේශ විනිමය ශ්‍රී ලංකාවට ලබාගෙන ඇති අතර ඉදිරියේදී තවත් රටවල් වැඩි ප්‍රමාණයකට අපනයනය කිරීමට සැලසුම් යොදා ඇති බව ද සතුටින් දන්වා සිටිමු.



ලංකා සුමේධා නිෂ්පාදන අලෙවි කිරීම සඳහා ජර්මනියේ Frankfurt නගරයට ආසන්න පිහිටි නගරයේ විවෘතව ඇත. ලංකා සුමේධා නමින් වෙළඳ සැලක් විවෘත කිරීමට ලැබීම අප ආයතනය ලද භාග්‍යයකි. එය විදේශ රටක පවත්වාගෙන යන ප්‍රථම සහ එකම හඳුන්කූරු වෙළඳ සැලයි.

Sri Lankan first and only incense sticks show room opened at Bad Arolson in Frankfurt, Germany by Lanka Sumeda. Website : https://lanka-sumeda.de

Lanka Sumeda - Exzellente Räucherstäbchen - Direktimport von Thai Sumeda - Sri Lankas Nummer 1.

## ලංකා සුමේධා ආයතනය ගැන ප්‍රවෘත්ති පත්‍ර සහ සඟරා කිහිපයක ලියැවුණු දේ මෙසේය.




**THAI SUMEDA ENTERPRISES**
322 B, Kotte Road, Pitakotte, Sri Lanka. Tel: +94 11 2824087
E mail: thai.sumeda@yahoo.com Web: www.thaisumeda.com
**Hot Line - 077 77 88 565**